පෙරදිග සංගීතය - 10 ශ්‍රේණිය

# කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය

- පෘතුගීසීන් හා කාපිරි ජනයා අතර ප්‍රචලිතව තිබූ ගීත සම්ප්‍රදායකි.
- වහල් සේවයට පැමිණි කාපිරි ජනයා ඔවුන්ගේ වෙහෙස නිවාගැනීමට බාල මහලු සියල්ල එක්ව නටමින් මේ ගීත ගයා ඇත.
- පළමුව පුත්තලම, මඩකලපුව වැනි මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත.

## කපිරිඤ්ඤා ගී වල ලක්‍ෂණ

- සරල තනු ඇත.
- වේග රිද්ම ගායන හා වාදන ඇත.
- 6/8 රිද්මය හෙවත් බෙම්ටෝ තාලය ඇසුරු කිරීම.
- ස්පාඤ්ඤ භාෂාව යොදා ගැනීම.
- ගීතයේ වේගය ක්‍රමයෙන් වැඩිවීම.
- නටමින් ගීත ගායනය.
- වයලීනය හෙවත් රවිකිඤ්ඤය, රබාන, බැංජො, වියෝලාව වැනි සංගීත භාණ්ඩ හා ආදේශ භාණ්ඩ යොදා ගැනීම.
- ජන සංගීතයේ විරිඳු හා බයිලා තනුවලට සමානකම් තිබීම.
- පසු කාලයේ මෙම ශෛලිය ඇසුරු කොට සරල ගී නිර්මාණය විය. ඒවා ගැයූ ශිල්පීන් අතර C.T.ප්‍රනාන්දු, M.S.ප්‍රනාන්දු, වොලි බැස්ටියන් ප්‍රචලිතය.

## කපිරිඤ්ඤා ආරට නිර්මිත සරල සිංහල ගීත

1. රස ආහර කවලා
2. මී වදයකි ජීවිතේ
3. යමං බන්ඩො වෙසක් බලන්න
4. සිංහල රජ කාලේ නෙමෙයි
5. කුස්සි අම්මා සේරා
6. නානා වියෝලේ
7. අයිරින් ජොසපින් රොසලින්

**ඉහත තොරතුරු ඇසුරෙන් පහත උපදෙස් ක්‍රියාවට නංවන්න.**

- කපිරිඤ්ඤා සංගීත සම්ප්‍රදාය හඳුන්වන්න.
- එය ව්‍යාප්ත වූ ප්‍රදේශ ලියන්න.
- ඉහත සිංහල සරල ගී වලට අමතරව ඔබ විසින් හඳුනාගත් ගීත ලැයිස්තුවක් දක්වන්න.
- කපිරිඤ්ඤා සංගීතය ලංකාගමනය තලින් අප රටේ සංගීතයට වූ වාසි හා අවාසි වගුගත කරන්න.

සැකසුම

රෝහණ ජයකොඩි